**වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූනු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදනය හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය**

# ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

## ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය - 03 සේවා ණයට අයත් තාක්ෂණ සහායක III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති තාක්ෂණ සහායක III ශ්‍රේණියේ තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. වැටුප් පරිමාණය :**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 යටතේ MT 1-2016 වැටුප් පරිමාණය අනුව

රු. 29840 – 10x300 – 11x350 – 10x560 – 10x660 – 48,890/-

**02. තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

අයදුම්කරුවන් ලිඛිත විභාගයකට යොමු කරන අතර, එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබාගත්තා අයදුම්කරුවන්, එම විභාගයේ දී විෂයන් දෙක සඳහාම ලබාගත් මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

**03. අයදුම්කිරීම :**

ඉල්ලුම්පත්‍රය, www.agrariandept.gov.lk වෙබ් අඩවියේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව ඒ4 කඩදාසියේ (21cm x 29cm) දෙපැත්ත භාවිත කරමින් සකස් කර අපේක්ෂකයා විසින් තම අත් අකුරෙන්ම පිරවිය යුතුය. අයදුම්පත්‍ර 2020.11.13 දින හෝ ඊට පෙර ලැබෙන සේ "ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ.පෙ. 537, කොළඹ 07" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක, III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය – 2020" ලෙස සඳහන් කළ යුතුය. අපේක්ෂකයා / අපේක්ෂිකාව තමා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු සඳහා www.agrariandept.gov.lk වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

**ඩබ්.එම්.එම්.බී. වීරසේකර**
**ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්**

**2020 ඔක්තෝම්බර් මස 16 දින,**
**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,**
**තැ.පෙ. 537,**
**කොළඹ 07.**